ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

BOC ඉතුරුම් ගිණුම				
නිමැවුමේ ස්වභාවය	**ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ**	**ආරම්භක තැන්පතු හා ගාස්තු**	**සුදුසුකම**	**ප්‍රධාන නියම හා කොන්දේසි**
සාමාන්‍ය ඉතුරුම් ගිණුම	• **පොලී අනුපාතය** නවතම පොලී අනුපාතය බලාගැනීමට https://www.boc.lk/ratestariff#rupeedeposit-rates වෙත පිවිසෙන්න. • ගිණුම් ශේෂයෙන් 90%ක උපරිමය දක්වා ක්ෂණික ණය ලබාගත හැකිවීම.	- **ආරම්භක තැන්පතුව** - රු.1,500/- • ගිණුමේ අවම මාසික සාමාන්‍ය ශේෂය රු.1,500/-ට වඩා අඩු වේ නම්, **මසකට රු.35** බැගින් අයකරනු ලැබේ. - **ගිණුම වසාදැමීමේ ගාස්තු** – රු.500/- - **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු** - ATM කාඩ්පත් නිකුත්කිරීම - බැංකු ප්‍රකාශ ලබාගැනීම - පාස්පොතේ අනු පිටපතක් නිකුත්කිරීම - ගිණුම් ශේෂයන් තහවුරු කිරීම - ස්ථාවර නියෝග ලියාපදිංචිය සහ මුදල් හුවමාරුකිරීම් - SMS Alerts ගාස්තු - ATM වෙතින් මුදල් ගැනීමේ සීමාව වෙනස්වීම - අන්තර්ජාල බැංකුකරණ සේවා ගාස්තු ගාස්තු දැනගැනීමට https://www.boc.lk/rates-tariff#general-tariff වෙත පිවිසෙන්න. - **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.	• වයස අවු. 18ට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසිකයන්ට මෙම ගිණුම විවෘත කළ හැකිය. • බද්ධ ගිණුම් විවෘත කළහැකිය. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** – ජාතික හැඳුනුම්පතේ (NIC)/ NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්; - දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන; - ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග, • ඉනිරිකිරීමේ ගිණුම් විවෘතකිරීමේ විශේෂ අයදුම්පත පූරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.	• මෙම නිමැවුම සඳහා වන යම් කොන්දේසි සහ/හෝ ඒ යටතේ පිරිනමන පහසුකම් වෙනස්කිරීමේ, එකතු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ අයිතිය බැංකුව සතුය. • නිමැවුමට අදාළ සියලුම නියම හා කොන්දේසි දැනගැනීම සඳහා ගිණුම විවෘතකිරීමේ අයදුම්පත බලන්න.

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.

- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රියව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.

දුරකතන: +94 11 220 4750 / +94 11 243 5814 **ෆැක්ස්**: +94 11 243 5815 **විද්‍යුත් ලිපිනය**: bocexmgt@boc.lk **වෙබ් අඩවිය:** https://www.boc.lk

තැපැල: ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

අපගේ කුමන හෝ ශාඛාවක්, සේවා ඒකකයක්, හෝ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.

අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.

Classification: Internal

Classification: Internal